**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

# පුරප්පාඩු

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

2026 පෙබරවාරි 2 වන දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2026 ප්‍රකාරව, කොළඹ තදසන්න දුම්රිය ව්‍යාපෘතියේ (CSRP) පහත සඳහන් තනතුරු සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) :**

ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය පහසුකම් යටතේ, ප්‍රවාහන, මහාමාර්ග, නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මහ පෙන්වීම යටතේ 2026.12.31 දින දක්වා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

පහත දක්වා ඇති අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතා සපුරාලන, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය, රජයේ රෙගුලාසි පිළිබඳ අවබෝධය, විදේශ අරමුදල් ව්‍යාපෘති පරිසරයක වැඩ කිරීමේ පළපුරුද්ද හා පරිගණක සාක්ෂරතාවය සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

දුම්රිය ක්ෂේත්‍රයෙහි (අයදුම්කරනු ලබන තනතුරට අදාළ ක්ෂේත්‍රයන්හි) දැනට කටයුතු කරන අයදුම්කරුවන් මේ සඳහා අයදුම් කිරීමට දිරිගන්වනු ලැබේ.

| තනතුර | සුදුසුකම් |
|---|---|
| **01. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (පාරිසරික හා සමාජ ආරක්ෂණ)**<br>**පුරප්පාඩු සංඛ්‍යාව -1**<br>**B කාණ්ඩය**<br>-<br>සමාජ ආරක්ෂණ හා පාරිසරික ප්‍රතිපත්ති පිළියෙල කිරීම, සමාජ ආරක්ෂණ හා පාරිසරික සැලසුම් නිර්මාණය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළව කරුණු හා කටයුතු හඳුනා ගැනීම් හා එහි වගකීම් භාරය දැරීම සඳහා වග විය යුතුය.<br>**02.නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)**<br>**පුරප්පාඩු සංඛ්‍යාව -1**<br>**B කාණ්ඩය**<br>ආසියානු සංවර්ධන බැංකු මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය, ප්‍රසම්පාදන කාලසටහන සකස් කිරීම, ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම, ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම, ප්‍රසම්පාදන කාර්යය ප්‍රශස්ථ හා කාලෝචිත අයුරින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.<br>ප්‍රසම්පාදනය, ගිවිසුම් සකස් කිරීම, ප්‍රසම්පාදනය ආශ්‍රිත සාමාන්‍ය ගෙවීම් ආදිය සම්බන්ධයෙන් තීරණ ගැනීමට සහායවීම සම්බන්ධයෙන් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වගකිව යුතුය. | (පහත අනු අංක 01 හෝ 02 හෝ 03 අතරින් එක් සුදුසුකමක්)<br>01. අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකුවීම/ එවැනි ආයතනයකින් ලබා ගත් සමාන වෘත්තීය සුදුසුකමක්<br>සමඟ<br>සුදුසුකම් ලැබීමෙන් පසු, අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 14 ක පළපුරුද්දක් හා ඉන් අවුරුදු 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br>02. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වයක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්<br>සමඟ<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 12 ක පළපුරුද්දක් හා ඉන් අවුරුදු 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.<br>03. රජයේ දීප ව්‍යාප්ත සේවාවක 1 ශ්‍රේණියේ නිලධාරියෙකුවීම හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තනතුරක් දැරීම.<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකු වීම/ එවැනි ආයතනයකින් ලබා ගත් සමාන වෘත්තීය සුදුසුකමක්<br>සමඟ<br>පළමු ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 06 ක පළපුරුද්දක් තිබීම |
| **03. ප්‍රසම්පාදන විශේෂඥ**<br>**පුරප්පාඩු සංඛ්‍යාව -1**<br>**C කාණ්ඩය**<br>ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම, ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශනය අනුව ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සකස් කිරීම, ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම, ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශනය අනුව ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම, ගිවිසුම් සකස් කිරීම යන ආදියට වගවිය යුතුය. | (පහත අනු අංක 01 හෝ 02 හෝ 03 අතරින් එක් සුදුසුකමක්)<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකුවීම/ එවැනි ආයතනයකින් ලබා ගත් සමාන වෘත්තීය සුදුසුකමක්<br>සමඟ<br>සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද<br>02. අදාළ ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකුවීම/ එවැනි ආයතනයකින් ලබා ගත් සමාන වෘත්තීය සුදුසුකමක්<br>සහ<br>සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ කළමනකාරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද<br>03. රජයේ දීප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ නිලධාරියෙකුවීම හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තනතුරක් දැරීම.<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකුවීම/ එවැනි ආයතනයකින් ලබා ගත් සමාන<br>වෘත්තීය සුදුසුකමක්<br>සමඟ<br>I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්දක් තිබීම. |

ඉහත සුදුසුකම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 හි ඇමුණුම 01 හි වගුවේ අයදුම් කරන ලද තනතුරට අදාළව තුන්වන තීරුවේ දක්වා ඇති සුදුසුකම් බලන්න.

**වැටුප් පරාසය :_**

| | | |
|---|---|---|
| 01 | B කාණ්ඩය | 370,000– 2X10,000 – 390,000 |
| 02 | C කාණ්ඩය | 285,000 – 2X10,000 – 305,000 |

මීට අමතරව 2026 පෙබරවාරි මස 02 වැනි දිනැති මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 හි නියමයන්ට අනුව ගෙවනු ලබන රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

01. වයස් සීමාව: අවුරුදු 64 ට අඩු (අවුරුදු 64 ට වැඩි අය සලකා බලනු නොලැබේ).
02. සේවක අර්ධසාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 08% හා සේවා යෝජකයාගෙන් 12% වන අතර සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වය මාසික වැටුපෙන් 3% කි.
03. සේවයෙහි යෙදවීම පිළිබඳ කොන්දේසි : පත්වීම 2026.12.31 දක්වා කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරෙන අතර, ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ වුවහොත් පමණක් සතුටුදායක කාර්ය සාධනය අනුව සේවය දීර්ඝ කිරීමේ හැකියාව පවතී.

**අයදුම්කිරීම :**

සියලුම අයදුම්කරුවන්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ද ඇතුළත් කර සකස් කරන ලද ස්වකීය ජීව දත්ත පත්‍රිකාව, සියලුම සහතිකවල පිටපත් ද සහිතව පහත දක්වා ඇති ලිපිනයට 2026.03.13 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සේවාවල නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුය.

**වැඩිදුර විස්තර සඳහා -**

**දුරකථන : 011- 2187211**
**ෆැක්ස් : 011-2187205**
**විද්‍යුත් ලිපිනය : admin@transport.gov.lk**

**ලේකම්,**
**ප්‍රවාහන, මහාමාර්ග, නාගරික සංවර්ධන අමාත්‍යාංශය (ප්‍රවාහන අංශය)**
**07 වන මහළ, සෙත්සිරිපාය - අදියර 02,**
**බත්තරමුල්ල.**
**2026.02.27**